# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1885/32 - 2014 ඔක්තෝබර් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2014.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(xii).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු කැළණිය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව සඳහන් කරනු ලබන 2011 ජූනි මස 24 වැනි දින අංක 1711/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත 2006 ජූලි මස 22 වැනි දින අංක 1454/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "විද්‍යා පීඨය" යන සටහනට අනුරූපීව එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන "සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය" යන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"7. සත්ත්ව විද්‍යා සහ පරිසර කළමනාකරණ අධ්‍යයන අංශය.".

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2014 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

11 - 97